GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/03/25

**මාධ්‍ය නිවේදනයයි**

**වෛද්‍යවරුන්ගේ සේවා ව්‍යවස්ථාව**

2006/06 චක්‍ර ලේඛණයට අනුකූලව වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ සිදුවිය යුතු සංශෝධිත පිළිබඳ නිර්දේශ 4ම ලබා දී තිබියදීත් රාජ්‍ය සේවා කොමිසන් සභාව වසර 02 ක් තිස්සේ අනුමත කිරීම ප්‍රමාද කල බව පැහැදිලිය.

මෙම අවස්ථාවේ අසාධාරණයට පිළියම් සෙවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යය මෛත්‍රීපාල සිරිසේන මහතාත් ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාත්, කැබිනට් මණ්ඩලයේ ලේකම් සුමිත් අබේසිංහ මහතාත්, මුදල් අමාත්‍යාංශ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතාත්, සෞඛ්‍ය ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක මහතාත්, වැටුප් කොමිසමේ ලේකම් බන්දු විජේරත්න මහතාත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් පී.බී. අබේකෝන් මහතාත් එක්ව ගත් පොදු උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස මෙය කැබිනට් අනුමැතියකින් විසඳීමට තීරණය විය. ඒ අනුව සෞඛ්‍ය ඇමතිතුමා කැබිනට් සංදේශය ඉදිරිපත් කෙරිණි.

වෛද්‍යවරුන්ට 2006 සිට දීර්ඝ කාලයක් තිබූ මේ අසාධාරණය විසඳීමට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පෞද්ගලිකව මැදිහත් වී ඊට අනුමැතිය ලබාදීම අප බෙහෙවින් අගය කරමු. අඩුම වියදමකින් ඉහලම ගුණාත්මකභාවයකින් යුතු සෞඛ්‍ය සේවාවක් සැලසීමට දායක වූ වෛද්‍යවරුන්ගේ සේවාව පිළිබඳ වැටහීමෙන් අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ඉහල නිලධාරීන් ගන්නා ලද උත්සාහයට අප හෘදයාංගම ස්තූතිය පුද කරමු.

කැබිනට් අනුමැතිය ලද වෛද්‍ය සේවා ව්‍යවස්ථාව ඉදිරි සති දෙක තුල ගැසට් පත්‍රයක් ආකාරයෙන් නිකුත් කිරීමට අවශ්‍ය පියවර අදාල නිලධාරීන් විසින් ගනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වෙමු.

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා : | වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - | 0717876516 |